# වෙළෙඳ බලපත්‍ර නිකුත් කිරීම

බල ප්‍රදේශය තුළ සිදු කරන ඇතැම් ව්‍යාපාරවලින් හෝ කර්මාන්තවලින් පුරවැසියන්ගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂාවට බලපෑමක් සිදු විය හැකි ක්‍රියාකාරකම් විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සාදනු ලැබ ඇත. මේ අතුරු ව්‍යවස්ථාවල නියමවලට යටත් වන සෑම ක්‍රියාකාරකමක් ම පවත්වාගෙන යන ස්ථානය වෙනුවෙන් වෙළෙඳ බලපත්‍රයක් ලබා ගත යුතු ය.

එවැනි බලපත්‍රයක් ලබා ගන්නේ කෙසේ ද?

**නොවැම්බර් 15**

සෑම වර්ෂයක ම නොවැම්බර් මස 15 වන දිනට පෙර ආදායම් ප්‍රභව සමීක්ෂණයට සමගාමීව වෙළෙඳ බලපත්‍ර සඳහා ඉල්ලුම් පත්‍ර බෙදා දීම

**නොවැම්බර් 20**

සෑම වර්ෂයක ම නොවැම්බර් මස 20 දිනට පෙර සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍ර එකතු කරනු ලැබේ

ආදායම් පරීක්ෂක විසින් තාක්ෂණ නිලධාරීගේ නිර්දේශය ප්‍රමාණවත් ඉල්ලුම් පත්‍ර වෙනමත්, මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ නිර්දේශය අවශ්‍ය ඉල්ලුම් පත් වෙනමත් වෙන් කර විෂය භාර නිලධාරී වෙත බාර දෙනු ඇත.

**දෙසැම්බර් 15**

මහජන සෞඛ්‍ය පරීක්ෂක හෝ තාක්ෂණ නිලධාරී විසින් අදාළ පරිශ්‍ර පරීක්ෂාවෙන් පසු නිර්දේශ සහිත ඉල්ලුම් පත්‍ර විෂය භාර නිලධාරීට බාර දෙයි.

නිර්දේශිත ඉල්ලුම් පත්‍ර, විෂය භාර නිලධාරී විසින් නාගරික කොමසාරිස් / සභාපති වෙත අනුමතයට ඉදිරිපත් කෙරේ

අනුමතය ලැබූ ඉල්ලුම් පත්‍ර සඳහා වෙළෙඳ බලපත්‍ර සකස් කර නාගරික කොමසාරිස්ගේ / සභාපතිගේ අත්සන ලබා ගෙන පෙරටු කාර්යාලයට යොමු කරනවා

**ජනවාරි 01**

ජනවාරි 01 ට පෙර
බලපත්‍රය සූදානම් බව සහ ගාස්තු ගෙවා බලපත්‍රය ලබාගන්නා ලෙස ඉල්ලුම්කරුට දැන්වීම

බලපත්‍රය නිකුත් කිරීම නිර්දේශ කර නොමැති විට ...... ?

අඩුපාඩු නිවැරදි කර නැවත දෙසැම්බර් 15 දිනට පෙර බාර දෙන ලෙස විෂය භාර නිලධාරී විසින් ඉල්ලුම්කරුට දැන්වීමක් කරනවා

අඩුපාඩු නැවත පරීක්ෂා කිරීමට පෙර ක්‍රියාවලිය ආරම්භ කරනු ඇත